
# මියුරු සංගීතඥයා

## සහ තවත් කෙටි කතා




**කර්තෘ-චමෝද් සචේතන විජේරත්න**

කෘතියේ නම-මියුරු සංගීතඥයා සහ තවත්
කෙටි කතා

කර්තෘගේ නම-චමෝද් සචේතන විජේරත්න

කෘතිය පළ කරන දිනය-2025-02-08
*(විද්‍යුත් පොතක් ලෙස)*

කතෘගේ වෙනත් කෘති- *කෙටි කතා*
■පුංචි බලු පැටියෙකුගේ කතාව

**ISBN 978-624-208-736-8**

# පිදුම

නින්ද යන තුරු කතන්දර කියා දුන්
ආදරණීය පියාණන්ට

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# පටුන


| පිටුව | කතාව |
|---|---|
| 06 | ආරම්භයක් නොමැති අවසානයක් |
| 09 | 2332 |
| 12 | අත්තක් කළ හදියක් |
| 15 | සාර්ථක වූ උත්සාහය |
| 20 | සටහන් පොත |
| 22 | මියුරු සංගීතඥයා |

# ආරම්භයක් නොමැති අවසානයක්

මම සෑම දිනකම උදෑසන 7.30 පමණ වන විට කාර්යාලය බලා යන්නෙමි. මම කාර්යාලය දක්වා ගමන් කරන මාර්ගයේ එක්තරා විශේෂ අමුත්තෙකු සිටී. එනම් වැරහැලි ඇඳ ගත් යාචකයෙකි. ඔහු විශේෂ අමුත්තෙකු වන්නේ කෙසේදැයි ඔබට සිතෙනවා ඇත. නමුත් මට නම් ඔහු විශේෂ පුද්ගලයෙකි. මන්ද මා මාසයක් වෙහෙස වී ලබා ගන්නා වැටුප මෙන් මුදලක් ඔහු මෙම සිඟා කෑමෙන් දිනකින් සොයා ගනී. තමා අසලින් යන ඕනෑම පුද්ගලයෙකුගෙන් රුපියල්ක් හෝ ලබා ගැනීමේ හැකියාවක් ඔහුට තිබුණි. මම ද සෑම දිනකම යාමේ දී හා ඒමේ දී රුපියල් 10 බැගින් ඔහුට ලබා දෙන්නෙමි.

දිනක් එක්තරා ආකාරයක අහඹු සිදුවීමක් සිදුවිය. එදින සෙනසුරාදා දිනයක් විය. සිකුරාදා දින හදිසි නිවාඩු ලබා ගැනීම නිසා මා හට සෙනසුරාදා දින ද කාර්යාලයේ වැඩ කිරීමට සිදු විය. එදින වැඩ අධික වූ බැවින් මා දුම්රිය ස්ථානයට පැමිණෙන විට රාත්‍රී 8 පමණ විය. මම යාමට නියමිත දුම්රිය තිබුණේ රාත්‍රී 9.30ට ය. මම කාර්යාලයේ කලමනාකරුට සිතින් බැණ වදිමින් අසල තිබූ බංකුවක අසුන් ගතිමි. මා අසුන් ගෙන සුළු වේලාවකට පසු එතැනට තවත් පුද්ගලයෙක් පැමිණ අසුන් ගත් බව මට දැනුනි. මම එදෙස හැරී බැලුවෙමි. පුදුමයකි! එතැන විශාල පොලිතීන් බෑගයක් තිබුණි. ඒ අසල ම කුඩා සටහනක් ද තිබුණි. එහි මෙසේ සඳහන් විය,

"ප්‍රිය මහතාණෙනි,

ඔබ මා හට සෑම දිනෙක ම ලබා දෙන රුපියල් විස්සට බොහෝ පින්. මමත් බොහෝ කාලයකට කලින් මහත්තයා වගේ වැඩ කරගෙන හිටියා මහත්තයා වැඩ කරන Office එකට එහා පැත්තෙ තියෙන Office එකෙයි මම වැඩ කරගෙන හිටියේ. අද මම ඉන්න තැන මීට අවුරුදු 15කට කලින් වයසක හිඟන්නෙක් හිටියා. මමත් මහත්තයා වගේ ම ඒ මනුස්සයාට රුපියල් 2 ගානෙ දුන්නා. ටික කාලෙකට පස්සෙ මේ මනුස්සයා මැරිලා ගියා. මට එවෙලෙ හිතුනා 'අනේ මමත් මෙහෙම හිඟා කෑවනම් මැරි මැරි සල්ලි හොයන්න ඕනෙ නැහැ නේද' කියලා. සල්ලිවලට තියෙන පෙරේතකම හින්ද ම මම එතැනට ඇවිත් හිඟා කන්න පටන් ගත්තා. මම ගෙදරට කියලා ගියේ Bussinuse එකක් කරන්න යනවා කියලයි. මම දැන් අවුරුද්දක් විතර තිස්සේ මේ බොරුව කරනවා. ඒත් අද මට මගේ මල්ලි හම්බුණා. මල්ලි මාව අඳුරගත්තා. එයා මට හොඳටම දොස් කිවුවා. එයා හෙට ගෙදර යනවා. එයා අනිවාර්යයෙන් ම මේ ගැන අම්මට කියයි. මම
මම ගැනම තීරණයක් ගත්තා. මහත්තයා බහින ඉස්ටේසම එහා පැත්තෙ සුදු හුණු ගාපු ගේ අපේ ගෙදර. මහත්තයා ගෙදර ගිහින් ඔය මල්ල අම්මට ගිහින් දෙන්න. ඒකෙ තියෙන්නේ මම අවුරුද්දක් තිස්සෙ හම්බ කරපු සල්ලි. මහත්තයා මම ගැන හොයන්න එපා.

මීට,
මහත්තයාගෙන් රුපියල් විස්ස
ගාණෙ හොරා කන හිඟන්නා "

ගත වූයේ සුළු මොහොතකි. හදිසියේ තිරිංග තද කරන දුම්රියක හඬ සමඟ මිනිසුන්ගේ විලාපය ඇසෙන්නට විය. මා එදෙසට දිව යාමට සැරසෙද්දී ම මා යාමට නියමිත දුම්රිය පැමිණෙන හඬ ඇසුණි. යාචකයාගේ තීරණයට ඉඩ දී මම දුම්රියට නැගීමට සූදානම් වුණෙමි.

# 2332

එදින මම නින්දට ගියේ මදක් ප්‍රමාද වීලා ය. එයට හේතුට වූයේ මම 2332 පිළිබඳ කියැවුණු චිත්‍රපටයක් නැරඹීමයි. මම නින්දට ගියේ ද එම චිත්‍රපටයෙහි කොටස් මෙනෙහි කරමිනුයි.

මම නින්දෙන් අවදි වූ විට මා සිටියේ අමුතු ම ලොවකය. නමුත්, මට මෙහි හුරු පුරුදු බවක් දැනේ. එවිට මා දුටුවේ මා අසලින් ඇවිද යන රොබෝවෙක් වැනි මිනිසෙකි. මම ඔහු අසලට ගොස් "සමාවෙන්න මහත්තයා, මේ කොහෙද?" යනුවෙන් ඇසී ය. එවිට එම මිනිසා "ඇයි තමුසෙ හිතුව ද මේ එංගලන්තෙ බකිංහැම් මාලිගෙ කියලා. මේ ලංකාව ඕයි" කියා යන්නට ගියේ ය. මම ඔහුට කොතරම් කතා කළත් වැඩක් නොවී ය. මා වටපිට බලන කළ රෑ බෝවී ඇති බව පෙනෙන්ට විය. වේලාව දැන ගැනීම සඳහා මම වටපිට බලන විට දුටුවේ අමුතු ම ආකාරයේ ඔරලෝසුවකි. එහි වේලාව පාන්දර 2.30 ලෙස දැක්විනි. මම මදක් ඉදිරියට ඇවිද යන්නට පටන් ගතිමි.

මිනිසුන් ඉතා කාර්බහුල බව පෙනෙන්නට තිබුණි. නමුදු ලංකාවේ ජනගහනය බොහෝ සෙයින් අඩුව ඇති බව මට දැනෙන්නට විය. මැදිවියෙහි මිනිසුන් පෙනෙන්නට සිටියේ ම නැත. අවුරුදු 10ක් පමණ වන ළමුන් පවා දරුවන් වඩාගෙන සිටින බව මට පෙනෙන්නට විය. කොසොල් රජතුමා දුටු සිහින සියල්ල සැබෑ වේගන එන සැටියක් ය මට පෙනුණේ. පොළොවේ ගමන් කළේ මිනිසුන් පමණි. වාහන සියල්ල අහසෙහි ගමන් කළ හැකි ආකාරයට සකස් කර තිබුණි.

ඒවායින් යම් කිසි කිරණක් නිකුත් වූ අතර එම කිරණ ඇඟට වැදීමෙන් හිසරදයක් ද ඇති විය. මේ අතර මට පෙණහළු සිරවෙනවා සේ දැනෙන්ට විය. මට යම්කිසි කැරකැවිල්ලක් දැනුණු අතර මට මතක මා ක්ලාන්ත වූ බව පමණි.

මම පියවි සිහියට පැමිණි විට මා දුටුවේ මා සිහිනෙකින්වත් නොසිතූ දෙයකි. වයස 50ට වැඩි එකඳු මිනිසෙකු නොසිටි මෙහි වයස 70ක පමණ කාන්තාවක් මට සාත්තු කරමින් සිටියා ය.

"පුතාගෙ ගෙවල් කොහෙද?" මා පියවි සිහියට පැමිණි බව දුටු ඇය ඇසුවා ය.

මම ඇයට සිදු වූ සියල්ල අකුරක් නෑර පැවසුවෙමි.

"හා... ඒකත් එහෙම ද? මම හිතන්නෙ පුතා ඔය දොස්තර රේඩියේටර්ගෙ වැඩක් නිසා මෙහෙ ආපු කෙනෙක් වෙන්න ඕනෙ"

"පොඩ්ඩක් ඉන්න. කවුද දොස්තර රේඩියේටර්?" මම ඇගේ කතාවට හරස් කැපුවෙමි.

"දොස්තර රේඩියේටර් අතීතයට ගමන් කිරීම ගැන පරීක්ෂණ කරන කෙනෙක්. අතීතයේ මිනිස්සුන්ගේ මනස වර්තමානෙ මිනිස්සුන්ට බද්ධ කරනවා" ඇය කීය.

"මනස බද්ධ කරනවා? ඒ කොහොමද?"මම පුදුමයට පත් ව ඇසුවෙමි.

ඔව් පුතා. මිනිහෙක් මරලා විනාසි පහක් ඇතුලත උපකරණයකට කරලයි මනස පිටතට ගන්නේ. ඒක ඕන ම මිනිහෙක්ට සම්බන්ධ කරන්න පුළුවන්" ඇය කීය.

"මරලා?" මම පිළිකුලෙන් යුතුව ඇසුවෙමි.

"ඔව් පුතා, පුතා දැන් ඉන්නෙ 2332කේ. මිනිසා දියුණු වෙලා. පෘථිවිය වැනසිලා. මිනිස්සු ඕන ම දෙයක් කරන්න පෙළඹෙනවා. පෘථිවියේ ඔක්සිජන් මට්ටම අඩු වෙලා. මිනිස්සු ඔක්සිජන් ටැංකි එල්ලගෙන ඉන්නවා.

පුතාට උපකරණ මොකුත් නෑනේ.ඒකයි පුතාට කලන්තේ දැම්මේ. මම ඔය රේඩියම් වාහනේක කිරණවලට අහුවෙලා Parralice වුණා. ඒකයි මෙච්චර වයසට ගියේ" ඇය කීය.

මට ක්ලාන්ත ගතියක් දැනෙන්නට වූ බැවින් මම නිදන්නට වීමි.

"පුතා නැගිටින්න" යනුවෙන් හුරු පුරුදු හඬක් ඇසෙන්නට වූ බැවින් මම අවදි වීමි. මම සිතුවේ ඒ මට උපකාර කළ මහළු කාන්තාව කියා යි. නමුත් මාගේ මව ඇඳ අසලට වී මා අවදි කරමින් සිටී.

"පුතා නැගිටින්නෙ නැද්ද? ඉස්කෝලෙ යන්න තියෙනවා." මම අවදි වුණෙමි.

මම මෙතෙක් වෙලා දැක ඇත්තේ සිහිනයකි. නමුත් එය සිහිනයක් පමණක් ම විය හැකි ද?

# අත්තක් කළ හදියක්

පවන් යනු සංචාරකයෙකි. එමෙන් ම පසිඳු ගහ කොළට ඉතා ආදරය කළ අයෙකි. ලෝකය වටේ ගමන් කර ඇති ඔහු දිනක් ලංකාව වටා සංචාරයක් යාමට ඇරඹීය. ගමනට අවශ්‍ය බඩු බහාරාදිය සකස් කරගෙන පවන් තම ගමන ආරම්භ කළේ ය. පවන් ජීවත් වූ 80 දශකයේ වාහන බහුල නොවූ බැවින් ඔහුට යාමට සිදු වූයේ පයින් ය. උදෑසන ම පිටත් ව බොහෝ දුර ගමන් කළ පවන්ට අධික වෙහෙසක් දැනෙන්ට විය. වටපිට බැලූ ඔහුට අතු විහිදුණු විශාල ගසක් පෙනෙන්නට විය. ඔහු එය යටට ගොස් නිදාන්නට විය.

ඔහුට සිහිනයෙන් ගසෙන් බැස එන වෘක්ෂ දේවතාවෙක් පෙනෙන්නට විය. එම වෘක්ෂ දේවතාවා පවන්ට මෙසේ කියන්නට විය.

"පුතුණුවනි, ඔබ ගහ කොළට ගතා ආදරය කරන්නෙක් බව පෙනේ. ඔබගේ සාර්ථකත්වයට මම ඉතා කුඩා උපකාරයක් පමණක් කරන්නෙමි."

පවන් එක්වර ම අවදි විය. පවන් වටපිට බැලුව ද කිසිවෙකු දක්නට නොවී ය. වටපිට බැලූ පවන්ට තමා අසල වැටී ඇති අත්තක් පෙනුණි. පවන් මෙය වෘක්ෂ දේවතාවා විසින් ලබා දුන් ත්‍යාගයක් යැයි සිතා එය රැගෙන ගමන පසුවට කල් දා නිවස බලා ගියේ ය

නිවසට ගිය පවන් තම දින වාර්තාව ලියන්නට පටන් ගත්තේ ය. එකල අද මෙන් පෑන් ජනප්‍රිය නොවී ය. සියලු දෙනා භාවිතා කළේ පැන්සල් ය. ඉතින් පවන් තම දින වාර්තාව ලිවුවේ ද පැන්සලකින් ය. මෙසේ

ලියමින් සිටින විට ඔහුට තමා ගෙන ආ අත්ත සිහි විය. ඔහුගේ දෑස් යොමු වූයේ තම පැන්සල දෙස ය. ඔහුට වහා ම අදහසක් ආවේ ය.

අසල නගරයට ගිය පවන් පැන්සල් සෑදීමට අවශ්‍ය උපකරණ රැගෙන ආවේ ය. ඉන්පසු මිනිරන් මිල වැඩි වන තුරු නොවිකුණා ගබඩා කාමරයෙහි තබා තිබූ මිනිරන් කුට්ටිය පිටතට ගත්තේ ය. තමා ගෙනා උපකරණ භාවිතයෙන් පැන්සල් සෑදීමට පටන් ගත්තේ ය. ඔහු ගෙනා අත්ත භාවිතයෙන් කුඩා ප්‍රමාණයේ පැන්සල් 10ක් පමණ සාදා ගත හැකි විය. පවන් එම පැන්සල් සියල්ල අසල නගරයට ගොස් වෙළෙන්දෙකුට විකුණුවේ ය. එම ගනුදෙනුවෙන් පවන් බලාපොරොත්තු නොවූ අන්දමේ ලාභයක් ලැබී ය. එම නිසා පවන්ගේ යහපත් චේතනාවන් වෙනස් විය.

පවන් පසු දින උදෑසන ම තම පොරොව ද රැගෙන තමාට උපකාරයක් ලෙස අත්තක් ලබා දුන් ගස වෙත ගියේ ය. ඉන්පසු එහි තිබූ සියලු අතු කපා දැමීය. ඒ අතු සියල්ල තම නිවස වෙත ඇදී ය. අනතුරු ව අසල තිබූ වනාන්තරයට ගියේ ය. ගොස් එහි ද විශාල වූ ගස් කිහිපයක ම අතු කපා දැමීය. ඉන්පසු තම නිවසට ගොස් පැන්සල් කිහිපයක් ම සෑදී ය. මෙසේ පැන්සල් සාදා විකිණීමෙන් පවන් බොහෝ ලාභ ලැබී ය.

කාලය ගත වෙත් ම නිමල් පැන්සල් සෑදීම සඳහා සේවකයන් කිහිපදෙනෙකු ද බඳවා ගත්තේ ය. පවන්ගේ පැන්සල් නගරය පුරා ජනප්‍රිය විය. නමුත් එම පැන්සල් නගරයෙන් පිට විකිණුනේ නැත. මන්ද ඒවා නීතිවිරෝධීව කපා ගත් ගස්වලින් සෑදූ පැන්සල් බැවිනි. පවන්ගේ දියුණුව නොරිස්සූ කිහිප දෙනෙකු නගරයෙහි විය. ඉන් එක් අයෙක් නම් පවන්ගේ පාසල් කළ මිතුරෙකු වූ, එමෙන් ම තවත් පැන්සල් නිශ්පාදකයෙකු

වූ නිමල් ය. ඔහුට පවන්ගේ හොර ලී කැපීම පිළිබඳ ආරංචි වූ බැවින් ඔහු පොලිසියට ගොස් මේ පිළිබඳ ව පැමිණිලි කළේ ය.

පොලිසිය පවන්ගේ නිවසට එන විටත් ඔවුන් ලී කැපීමට ගොස් තිබුණි. පොලිසියට තවත් සාක්ෂි අවශ්‍ය නොවූ බැවින් පවන් ඇතුළු පිරිස පැමිණි පසු පිරිස ම සිරගත කළේ ය. පවන්ගේ හොඳ ම සගයා වූ සමන් රජයේ සාක්ෂිකරුවෙකු වී පවන්ට විරුද්ධව සාක්ෂි ලබා දී නිදහස් විය. බන්ධනාගාරගත වන විට පවන් බොහෝ මිනිසුන්ගේ සැබෑ පැතිකඩ හඳුනාගෙන සිටියේ ය.

📖📖📖📖

# සාර්ථක වූ උත්සාහය

සමනලී යනු මධ්‍යම පාන්තික පවුලක උපත ලද කුඩා ගැහැණු ළමයෙකි. ඇය ජීවත් වූයේ අඩු ජනගහනයක් තිබූ කුඩා ගමකයි. සමනලී ඉගෙන ගත්තේ එහි තිබූ එකම පාසලේ යි. ගුරුවර ගුරුවරියන් 10 දෙනෙකු පමණ සිටි එම පාසලෙහි එතරම් ශිෂ්‍ය සංඛ්‍යාවක් ද සිටියේ නැත. සමනලීගේ පියා එම පාසලෙහි විදුහල්පතිවරයායි. ශිෂ්‍ය වර්ජනයකට සහය දැක්වීම හේතු කරගෙන ඔහු මෙහි සේවයට එවන ලද්දේ මීට වසර 3කට පෙරයි. තව වසර 7ක් ම ඔහුට මෙහි සේවයේ යෙදීමට සිදුවේ.

සමනලී ඉගෙනීමට මෙන් ම බාහිර කටයුතුවලට ද එක සේ දක්ෂ විය. 7 ශ්‍රේණියෙහි ඉගෙනුම ලබන සමනලී දිස්ත්‍රික් නෙට්බෝල් අනුශූරතාවය ද පාසලට හිමි කර දුන්නේ ය. ඒ පාසල් නෙට්බෝල් කණ්ඩායමේ නායිකාව ලෙස යි.

සමනලීට දිනක් එක් ප්‍රශ්නයක් ඇති විය. එනම් මෙම පාසලෙහි පුස්තකාලයක් තිබෙනවා ද යන්නයි. මේ පිළිබඳව අදහසක් නොතිබූ සමනලී තම මිතුරිය දෙව්මිණිගෙන් මේ පිළිබඳ ව විමසීය.

"මම නම් අහලා තියෙනවා අපෙ ඉස්කෝලේ ඉස්සර පුස්තකාලයක් තිබුණා කියලා. ඒත් දැන්නම් ඒකෙ කෑලි විතරයි ඇත්තේ. ගොඩනැගිල්ල ලාවට ඉතුරු වෙලා ඇති. ඒක තියෙන තැනක් නම් මම දන්නේ නෑ" දෙව්මිණී කීය.

"මේ ගැන දන්න කෙනෙක් නැද්ද?"සමනලී දෙව්මිණිගෙන් ඇසීය.

"මම හිතන්නේ ශිෂ්‍ය නායක අක්කා දන්නවා ඇති. එයා මේ ඉස්කෝලෙ හැම අස්සක් මුල්ලක් නෑර ම දන්නවා" දෙව්මිණි කීය.
"එහෙම නම් අපි යමු" කියා සමනලී පාසලේ ශිෂ්‍ය නායිකාව සොයා දිව යන්නට විය. දෙව්මිණි ද ඒ පසුපස දිව යන්නට විය.

පාසල ඉතා කුඩා වූ පාසලක් බැවින් පාසලට අවශ්‍ය වූයේ ශිෂ්‍ය නායකයෙකු හා ශිෂ්‍ය නායිකාවක පමණෙකි. පාසලේ ශිෂ්‍ය නායිකාව එවෙලෙහි සිටියේ විදුහල්පති කාමරයේ විශේෂ රැස්වීමකයි. එම රැස්වීම අවසන් වන තුරු සමනලීට සහ දෙව්මිණිට මඳක් රැඳී සිටින්නට විය.
"ආ ගෑනු ළමයි. මොකද මෙහෙ? මොකක් හරි වුවමනාවක් ද?" තමා හමුවට ආ දෙදෙනාගෙන් ශිෂ්‍ය නායිකාව ඇසී ය.
"ඔවු අක්කෙ ලොකු වුවමනාවක්" සමනලී කීය.
"කියන්න බලන්න" කුතුහලයෙන් යුතු වූ ශිෂ්‍ය නායිකාව පැවසුවා ය.
"අක්කෙ පරණ පුස්තකාලෙ කොහෙද තියෙන්නේ?" දෙව්මිණි ඇසුවා ය.
"පරණ පුස්තකාලෙ? ඒ මොකට ද?"ශිෂ්‍ය නායිකාව ඇසීය.
"අපිට ඒක බලන්න යන්න ඕනෙ අක්කෙ" සමනලී මෘදු ස්වරයෙන් පැවසීය
"බලන්න යන්න? පිස්සු ද? ඒක තියෙන්න අර ඈත. බලන්න කැළෑවත් වැවිලා"ශිෂ්‍ය නායිකාවට එය කියා කට ගන්නටවත් ලැබුණේ නැත. සමනලී ඒ දෙසට දුවන්නට විය. ශිෂ්‍ය නායිකාව ඇය අල්ලා ගන්නට උත්සාහ කළත් නෙට්බෝල් ක්‍රීඩිකාවකු වූ ඇය ව අල්ලා ගැනීමට නොහැකි විය.

"මොකද බලන් ඉන්නේ? ඔයත් යන්න. ඔයාගේ යාළුවනේ" සමනලී ගිය දෙස බලා සිටින දෙව්මිණී හට ශිෂ්‍ය නායිකාව කීවා ය. ඇය ද පියවි සිහියට එළඹී පසු එදෙසට දිව ගියා ය.

දෙව්මිණී එතැනට යන විට ම සීනුව හැඬවෙන්නට විය. ගරා වැටෙමින් තිබූ ගොඩනැගිල්ල දෙස බලා සිටි සමනලී පන්තිය දෙසට යාමට පිටත් විය. දෙව්මිණී ද ඒ පිටුපසින් යන්නට විය.

"හෙට අපිට ලොකු වැඩක් තියෙනවා" සමනලී දෙව්මිණීට කීවා ය.

"මොකද්ද ඒ?" දෙව්මිණී ඇසුවා ය.

"හෙට බලමුකෝ" කියූ සමනලී පන්තියට ගොඩ විය.

පසු දින උදා විය. දෙව්මිණී පාසලට පැමිණෙන විට සමනලී කැත්තකුත්, වීසි කැත්තකුත් අතැතිව සිටියා ය.

"මොකද මේ?" පුදුමයට පත් දෙව්මිණී ඇසුවා ය.

"මේක තමයි අපිට තියෙන වැඩේ. තව පැය බාගයක් තියෙනවා. ඔයා වීසි ගහන්න, මම ගස් කපන්නම්" සමනලී කීය.

"අනේ සමනලී" දුක්බර හඬින් දෙව්මිණී පැවසුවා ය.

"හරි හරි... දැන් යමු" දෙව්මිණී අතට වීසි කැත්ත දුන් සමනලී ගමන ඇරඹුවා ය.

දෙදෙනා ම පරණ පුස්තකාල භූමියට ගොස් වැඩ ආරම්භ කළා ය.

"සමනලී ඔයා කොහෙන් ද මේවා ගත්තේ?" යනුවෙන් දෙව්මිණී වැඩ කරන අතර ඇසීය.

"මම කෘෂි විද්‍යා ටීචර්ගෙන් ඉල්ල ගත්තේ" සමනලී පිළිතුරු දුන්නා ය.

"ටීචර් දුන්න ද ඉතින්?" දෙව්මිණී ඇසුවේ කෘෂි විද්‍යා ගුරුතුමිය සැර පරුෂ ගුරුවරයෙකු ලෙස ප්‍රකට බැවිනි.

“නෑ. මම බොරුවක් කියලා ඉල්ල ගත්තේ” සමනලී ඇසක් මරා පිළිතුරු දුන්නා ය.
“පුදුමයි ඔයා බොරුවක් කිවුවා” දෙව්මිණී පැවසුවේ සමනලී බොරුවක් කියන්නේ කලාතුරකින් බැවිනි
“හොඳ වැඩකට බොරුවක් කිවුවට කමක් නෑ දෙව්මිණී” යනුවෙන් පිළිතුරු දුන් සමනලී තම වැඩය ආරම්භ කළා ය.

කාලය කෙමෙන් ගෙවී ගියේ ය. වැඩයේ අවසන් කොටසේ දී පාසලේ සීනුව හැඬවෙන්නට විය.
“හපොයි සමනලී. දැන් මොකද කරන්නේ?” කලබලයට පත් දෙව්මිණී ඇසුවා ය.
“ඔහොම යං. තව ටිකයි නේ” සමනලී කලබලයෙන් තොරව කීය.
“සමනලී ඒත්... පළවෙනි විෂය. අනික ඉංග්‍රීසි” දෙව්මිණී බියට පත් ව පැවසුවා ය.
“හරි හරි... මම ටීචර්ට කියන්නම්. අපි වැඩ කරමුකෝ” දෙව්මිණී දිරිමත් කරමින් සමනලී පැවසුවා ය.

දෙදෙනා ම ලහි ලහියේ වැඩ කරන්නට විය. මිනිත්තු 10කට පමණ පසු පරණ පුස්තකාලයට යන මාර්ගය පිරිසිදු කිරීමට දෙදෙනාට හැකි විය.
“මේ ඇති. දැන් යමු” දෙදෙනා ම පන්ති කාමරය දෙසට දිව යන්නට විය. ඒ වන විටත් ඉංග්‍රීසි ගුරුතුමිය පන්තියේ සිටියා ය. සමනලී හා දෙව්මිණී දුටු ගුරුතුමිය කෝපයට පත් විය.
“ආ කොහෙද ගියේ? දෙව්මිණී... නටලා නටලා දාඩියත් දාලා. සමනලී... කිසි වගකීමක් නැද්ද? Principalගෙ දුව නේද? ඒක ද මෙහෙම? එනවා දෙන්නම” ඉංග්‍රීසි ගුරුතුමිය සමනලී හා දෙව්මිණී රැගෙන විදුහල්පති කාමරය දෙසට ගියා ය.
“Excuse me sir, May I come in ”

"ඇතුළට එන්න" ගැඹුරු කටහඬක් ඇසුණි

ඉංග්‍රීසි ගුරුතුමිය දෙදෙනාව ම රැගෙන ඇතුළට ගියා ය. දහඩිය පෙරාගෙන සිටින තම දියණිය දැකීමෙන් විදුහල්පතිතුමා පුදුමයට පත් විය.

"Sorry sir මෙහෙම කරන්න වුණාට. මේ දෙන්නා මගෙ Period එකේ නටලා නටලා ඇවිත් තියෙන්නේ. සර් මේ ගැන Decision එකක් ගන්න" කියූ ඉංග්‍රීසි ගුරුතුමිය පිටව ගියා ය.

"හොඳයි දැන් ඔයාලට කියන්න තියෙන දේ කියන්න" විදුහල්පතිතුමා කීවේ ය.

සමනලී සියලු දේ පැහැදිලි ව විදුහල්පතිතුමාට පැහැදිලි කළා ය. ඒ තම පියා වූ බැවින් එය පහසු විය. නමුත් දෙව්මිණී හඬා වැටෙන්නට විය.

"එහෙම ද? මමවත් දැනගෙන හිටියේ නෑ මේ වගේ පුස්තකාලයක් තියෙනවා කියලා. මම මේ ගැන බලන්නම්. ඔයාලා දැන් පන්තියට යන්න" සමනලී කියූ දේ ඇසූ විදුහල්පතිතුමා පැවසීය.

විදුහල්පතිතුමාගේ මූලිකත්වයෙන් පුස්තකාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය ඇරඹිණි. විවිධ දානපතියන් පුස්තකාලයට පොත් පරිත්‍යාග කළහ. පුස්තකාලය පිළිබඳ විදුහල්පතිට දැනුම් දුන් සමනලීගේ නමින් එම ගොඩනැගිල්ල නම් කෙරිණි

# සටහන් පොත

මලිත් තරමක ලැජ්ජාශීලී ළමයෙකි. ඔහු සිනහ වන්නේ කලාතුරකිනි. හඬන්නේ කලාතුරකිනි. කෝපවන්නේ කලාතුරකිනි. කතා කරන්නේ අල්ප වශයෙනි. ඔබ වුව ද මෙවැනි මිතුරෙකු ආශ්‍රය කිරීමට අකැමැති බව මම දනිමි. එබැවින් මලිත්ට සිටියේ මිතුරන් කිහිපදෙනෙකි. ඔවුන් සමඟ වුව ද මලිත් කතාබහ කළේ කලාතුරකිනි.

කෙසේ වුව ද මලිත් ඉගෙනීමට දක්ෂයෙකු විය. 4 වසරෙහි ඉගෙනුම ලබන මලිත් ඉදිරි ශිෂ්‍යත්ව විභාගයෙන් ඉහළ ලකුණක් ලබා ගනු ඇති බව සැවොම විශ්වාස කළහ. මලිත් ද ශිෂ්‍යත්ව විභාගය සමත් වීමට වෑයම් කළේ ය. නමුත් ඔහු අමතර පන්ති කිසිවකට සහභාගී නොවී ය.

කාලය වේගයෙන් ගෙවී ගියේ ය. මලිත් 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයට මුහුණ දෙන දිනය ළඟා විය. මලිත්ගේ දෙමව්පියන් විසින් බෝධි පූජාවක් පැවැත්වූ අතර ඊට වැඩි යමක් සිදු නොකරන ලදී. කෙසේ නමුත් මලිත් ශිෂ්‍යත්ව විභාගයෙන් ඉහළ ම ලකුණු ගෙන සමත් වෙන ලදී. මීළඟ ගැටලුව වූයේ මලිත් ව පාසලකට ඇතුලත් කිරීමයි. දෙමව්පියන්ගේ අදහස වූයේ මලිත්ව කොළඹ උසස් පාසලකට ඇතුළත් කළ යුතු බවයි. නමුත් මලිත් එයට අකැමැති විය. මන්ද ඔහුට දෙමාපියන්ගෙන් වෙන් ව සිටීමට තරම් ආත්ම ශක්තියක් නොමැති වීමයි. කෙසේ නමුත් අවසානයට මලිත්ව නගරයෙහි මධ්‍ය මහා විද්‍යාලයට ඇතුළත් කිරීමට තීරණය කළේ ය.

මලිත් නගරයේ මධ්‍ය මහා විද්‍යාලයට ඇතුළත් කරන ලදී. නමුත් එහි මලිත් දන්නා කියන කිසිවෙකු නොවී ය. එම නිසා මලිත් හට තනිකමක් දැනෙන්නට වුව ද ඔහුගේ ලැජ්ජාශීලී භාවය හේතුවෙන් ඔහුට මිතුරන් ඇති කර ගැනීම අපහසු විය.

මලිත් පන්තියේ උගන්වන විට පන්තියෙහි කෙළවරකට වී සිටියි. මෙය ගුරුවරුන්ට ගැටලුවක් වුව ද ඔවුන් එයට වැඩි අවධානයක් යොමු නොකළහ. විවේක කාලයේ දී පාසලේ මිලුලෙහි වූ බංකුවක වාඩි වී ආහාර ගැනීමට පුරුදු විය. කාලය ගත වීමත් සමග මලිත්ට මෙය හුරු පුරුදු චර්යාවක් බවට පත් වූ අතර අන් අයට ද එහි අමුත්තක් නොවී ය.

දිනක් මලිත් හුරු පුරුදු ලෙස බංකුවෙහි වාඩි වී ආහාර ගනිමින් සිටින විට අමුතු දෙයක් දුටුවේ ය. එය කොළ පැහැති පිටකවරයක් යෙදූ සටහන් පොතක් විය. ඔහු එය පෙරලා බැලීය. එහි විවිධ ආකාරයේ සටහන් තිබුණි. එක් සටහනක "මම අද හොඳට විනෝද වුණා" යැයි තිබුණි. තවත් සටහනක තිබුණේ "මට අද කෑම ගේන්න බැරි වුණා" යනුවෙනුයි. "මම හිතනවා මගෙ සුරතල් මීයා මගෙ සටහන් කන එක නවත්තයි කියලා" වැනි විහිළු සටහන් ද තිබුණි. කෙමෙන් කෙමෙන් මෙම සටහන් කියවීම පුරුද්දක් බවට පත් විය. ඔහු ද එහි විවිධ සටහන් ලියන්නට පටන් ගත්තේ ය. දිනක් ඔහු තම සටහනක මෙසේ ලිවුවා ය. "මේ සටහන කියවන කවුරුහරි හෙට විවේක කාලයේ දී මේ බංකුව ළඟට එන්න."

මලිත් පසු දින පාසල් ගියේ නව මිතුරෙක් ඇති කර ගැනීමේ අපේක්ෂාවෙනි. එම නිසා ඔහුගේ මුහුණෙහි දීප්තිමත් බවක් පෙනුණි. මෙම වෙනස ඔහුගේ පන්තියේ අයට ද දැනුණ ද ඒ පිළිබඳ ව

විමසිලිමත් නොවීය. මලිත් එදින විවේක කාලයේ සුපුරුදු බංකුව වෙත ඇවිද ගියේ ය. මලිත් දුටු දෙයින් ඔහු විස්මයට පත් විය. ළමුන් රැසක් තමාට සටහන් ලියන අමුත්තා දැක ගැනීමට පොරකමින් සිටියහ. මලිත්ගේ මුහුණෙහි කලාතුරකින් ඇඳෙන ආකාරයේ සිනහවක් ඇඳෙන අයුරු ඔවුන්ට පෙනුණි

ඔවුන් මලිත්ගේ මිතුරන් බවට පත් වීමට වැඩි කාලයක් ගත නොවී ය. දැන් මලිත් සුපුරුදු ලැජ්ජාශීලී ළමයා නොවේ. ඔහුට දැන් මිතුරන්ගේ අගය වැටහෙමින් පවතී.

# මියුරු සංගීතඥයා

මැතිව් එංගලන්තයේ ප්‍රසිද්ධ පාසලක ඉගෙනුම ලබයි. ඔහුගේ වයස අවුරුදු 12කි. මැතිව් සංගීතයට ඉතා ඇලුම් කළේ ය. ඔහුගේ මිතුරන් ද තරමක සංගීත වාදකයන් විය. නමුත් එහි යම්කිසි විශේෂත්වයක් විය. එනම් ඔවුන්ගේ සියලු මිතුරන් රොක් සංගීතය, පොප් සංගීතය වැනි නවීන සංගීතයට ඇලුම් කළ ද මැතිව් ඇලුම් කළේ ශාස්ත්‍රීය සංගීතයටයි. මැතිව් වඩාත් ම දක්ෂ වූයේ පියානෝව වාදනයටයි. මිතුරන් මැතිව් නවීන සංගීතයට යොමු කිරීමට තැත් කළ ද එවිට ඔහු ලබා දුන් පිළිතුර වූයේ "මගේ පියාගේ උරුමය තමයි මම ගෙනියන්නේ. මේ සංගීතය මට හොඳයි." යන්නයි.

මැතිව්ගේ පියා ද ශාස්ත්‍රීය සංගීතයට ඉතා ඇලුම් කළ අයෙකු විය. දෙවන ලෝක යුද්ධ සමයේ සෙබලුන්ට මැතිව්ගේ පියාගේ වයලීනයෙන් සිදු වූ මෙහෙය අති මහත් ය. මැතිව් හා පියාගේ වෙනස වන්නේ පියා වයලීනය වාදනය කිරීමත් මැතිව් වයලීනය වාදනය කිරීමත් ය.

මැතව් සංගීතයට ඉතා දක්ෂ අයෙකු ලෙස පාසල පුරා ප්‍රචලිත විය. සැමදා සංගීතය විශයට වැඩි ම ලකුණු ලබා ගත් මැතිව් ගුරුවරුන් අතර ද ගෞරවයට පාත්‍ර විය.

මැතිව්ගේ මෙම හැකියාව කනින් කොනින් පාසලේ විදුහල්පතිතුමාට ද අසන්නට ලැබිණි. විදුහල්පතිතුමා විසින් මැතිව්ව තම කාර්යාලයට කැඳවන ලදී.

“සුබ දහවලක් මැතිව්!” විදුහල්පතිතුමා විසින් මැතිව්ට සුබ පතනු ලැබිණි.
“සුබ දහවලක් සර්” මැතිව් ද ප්‍රතිආචාර කළේ ය.
“මට ආරංචියක් ලැබුණා මැතිවු හොඳ සංගීතඥයෙක් කියලා. ඒක ඇත්ත ද?” විදුහල්පතිතුමාගේ වචව මැතිව්ට තිගැස්සීමක් ඇති කිරීමට සමත් විය.
“සර් මට තරමක් සංගීතය පුළුවන්. ඒත් මම ඒ තරම් දක්ෂයෙක් නෙවෙයි” මැතිව් පිළිතුරු දුන්නේ ය.
“හරි. මැතිව්ට මොන වගේ සංගීත භාණ්ඩ ද වාදනය කරන්න පුළුවන්?” විදුහල්පතිතුමා ඇසී ය.
“මට පියානෝව තමයි සර් පුළුවන්” මැතිව් පැවසීය.
“හරි හොඳයි. මොන වගේ සංගීතය ද මැතිව්ට පුළුවන්? රොක්? පොප්?” විදුහල්පතිතුමා ඇසීය.
“ඕන එකක් පුළුවන් සර්” මැතිව් කිවුවේ ය.
“හරි. මැතිව්ගෙ සම්පූර්ණ නම කියන්න”
“මැතිව් අර්නෝල්ඩ්” මැතිව් පැවසුවේ ය.
“හොඳයි. ලබන මාසේ 29 වෙනි දා දක්ෂතා එළි දැක්වීමේ උත්සවය තියෙනවා. මැතිව් ඒකට සහභාගී වෙන්න ඕනේ” විදුහල්පතිතුමාගේ හඬ දෝංකාර දෙන්නාක් මෙන් මැතිව්ට දැනුණි.
“හරි දැන් යන්න” මැතිව් පිටව ගියේ ය.

මැතිව් පැමිණි පසු මිතුරන් ඔහුගෙන් විස්තර අසන්නට විය. මැතිව් සම්පූර්ණ සංවාදය ම ඔවුන්ට පැවසීය. අනතුරුව තම මතය ද හෙළි කළේ ය.
“මට නම් යන්න බැහැ. මම යන්නේ නැහැ” එම හඬ කොතරම් තීව්‍ර ද යත් මිතුරන්ට කිසිවක් කියාගත නොහැකි විය.
“ඉතින් ඒක එයාට ම කියන්න තිබුණානේ” එක් මිතුරෙක් තම මුව විවර කළේ ය.
“ඒ දේ කරන්න මට ශක්තියක් තිබුණා නම් මම

අනිවාර්යයෙන් ම කරනවා. ඒත්, බැහැ" මැතිව් පිළිතුරු දුන්නේ ය.
"දැන් ඉතින් ඔයාට යන්න ම වෙනවා" එක් මිතුරෙක් කීය.
"යන්න...යන්න..."මිතුරන් සියල්ලෝ ම හඬ නගන්නට විය.
"හොඳයි මම යන්නම්" මිතුරන් නිහඬ විය. "හැබැයි මම වාදනය කරන්නේ ඔයාලා කියන දේ" මැතිව් කීය.

මෙය මැතිව්ව නවීන සංගීතයට හරවා ගැනීමට හොඳ මඟක් යැයි සිතූ මිතුරන් ඔහුට වාදනය කිරීමට පොප් සංගීත බන්ඩයක් ලබා දුන්නේ ය.

කාලය ගත විය. උත්සවයට අදාළ දිනය උදා විය. අංග එකින් එක වේගයෙන් ගලා ගියේ ය. මීළඟට තිබුණේ මැතිව්ගේ අංගයයි. මිතුරන් මැතිව් දිරිමත් කරන්නට විය. "මම දන්නවා. මට බැහැ" කියූ මැතිව් වේදිකාවට ගොඩ විය. ප්‍රේක්ෂකාගාරයට ආචාර කර මැතිව් කිසිඳු වුවමනාවකින් තොරව වාදනය කරන්නට විය. ප්‍රේක්ෂකාගාරයට ද එය එපා වන සැටියකි දක්නට ලැබුණේ. මිනිත්තු 2කට පමණ පසු මැතිව් මයික්‍රෆෝනය අසලට ළඟා විය. "මහත්වරුනි, මම සංගීතය වෙනස් කරන්නම්. මෙය මට මෙන් ම ඔබට ද නීරස බව මට පෙනී යනවා." මැතිව් තමාට හුරු පුරුදු ශාස්ත්‍රීය වාදනයක් ආරම්භ කළේ ය. මුල දී ඇල් මැරුණු ගතියක් පෙනුණු ප්‍රේක්ෂකාගාරය ටිකෙන් ටික සංගීතය වින්දනය කිරීමට පටන් ගෙන තිබේ. මැතිව් තම වාදනය අවසන් කළේ ය. එක අත්පුඩියක්, දෙකක්, මුළු ප්‍රේක්ෂකාගාරය ම අත්පොළසන් දෙන්නට පටන් ගත්තේ ය. මැතිව් ප්‍රේක්ෂකාගාරයට ආචාර කර පහතට බැස ගියේ ය. මිතුරන් සියල්ලෝ ම ඔහුට සුබ

පතන්නට විය. අවසානයට,
"වසරේ දක්ෂත ම ශිෂ්‍යයා වන්නේ මැතිව් ආර්නෝල්ඩ්"
නම් විය.

📖📖📖📖

## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරිමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරිමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්